# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2039/4 - 2017 ඔක්තෝබර් මස 02 වැනි සඳුදා - 2017.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග :

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපායමාර්ග හා
ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2007 ඔක්තෝබර් මස 08 වැනි දිනැති අංක 1518/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ හා 2016 පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 1953/28 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ I වන උපලේඛනය, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :

(I) 2007 ඔක්තෝබර් මස 08 වැනි දිනැති අංක 1518/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* හා 2016 පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 1953/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, විශේෂ ආනයන බලපත්‍ර ගාස්තු නියෝගයන්හි සඳහන් අංක I දරන උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන, මෙහි පහත සඳහන් අයිතම සහ III වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී ගාස්තුව මෙයින් ඉවත් කරනු ලැබේ.

| *(I)*<br>*තීරය*<br>*ශීර්ෂ අංකය* | *(II)*<br>*තීරය*<br>*අයිතමය* | *(III)*<br>*තීරය*<br>*ආනයන පාලන බලපත්‍ර ගාස්තු* |
|---|---|---|
| 46 | තේ, (රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ) | මි. ර. ගැ. වටිනාකමින් 1% |

(II) 2007 ඔක්තෝබර් මස 08 වැනි දිනැති අංක 1518/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* හා 2016 පෙබරවාරි මස 11 වැනි දිනැති අංක 1953/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, විශේෂ ආනයන බලපත්‍ර ගාස්තු නියෝගයන්හි සඳහන් අංක I දරන උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන, මෙහි පහත සඳහන් අයිතම සහ III වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී ගාස්තුව මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *(I)*<br>*තීරය*<br>*ශීර්ෂ අංකය* | *(II)*<br>*තීරය*<br>*අයිතමය* | *(III)*<br>*තීරය*<br>*ආනයන පාලන බලපත්‍ර ගාස්තු* |
|---|---|---|
| 46 | ප්‍රති අපනයනය සඳහා ආනයනය කරනු ලබන තේ, (රසකාරක මිශ්‍ර කළ හෝ නොකළ) | එක් බලපත්‍රයක් සඳහා රු. 1,000.00 |

10-533

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.